"සුදු ලූනු 'ගේම ගැසූ' කෝටිපතියා මාට්ටු" යන සිරස්තලයෙන් යුතුව දිවයින පුවත්පතේ (10/07) පළ වී තිබූ පුවත් වාර්තාවක අන්තර්ගතයේ සඳහන්ව තිබුණේ, එම සැකකරු "දෙමළ ජාතික" ව්‍යාපාරිකයෙකු බවයි.

මාධ්‍ය ආචාර ධර්ම නිර්දේශයන් තුළ සඳහන් වන්නේ, යමෙකුගේ වර්ගය, ආගම යනාදී විස්තර පුවතකට ඍජුවම අදාළ නොවන්නේ නම් ප්‍රකාශ කිරීමෙන් වැළකිය යුතු බවයි.

ඒ අනුව ගත් විට, මෙම වාර්ගිකත්වය ප්‍රවෘත්තියට අදාළ නොවන්නේ නම් "දෙමළ" වාර්ගිකත්වය සඳහන් කළ යුතු යැයි ඔබ සිතන්නේද?

මෙම වාර්ගිකත්වය ඍණාත්මක සන්දර්භයකදී ඉස්මතු කර තිබීම ඔස්සේ, එම වාර්ගිකත්වය ඍණාත්මකව ඒකාකෘතික කිරීම් වලට ලක්වීමේ ඉඩක් නැතිද?

**#MediaEthicsSL #lka #sinhalanews #Divaina**